# ගමට අවශ්‍ය කුමක්ද?

## ජනතාව දකින සංවර්ධනය

"අද ගම්බද සම්පත් නගරයට ගලා ඒම වේගවත් වෙලා. විශේෂයෙන්ම ගමේ අගනා සම්පත්වූ ගැමි බුද්ධිමතුන්ගේ සේවය ගමට අහිමි වෙනවා. ඔවුන් බොහෝ දෙනෙක් වැඩි පහසුකම් සොයා අගනුවරටත් එතනින් විදේශයන්ටත් සේන්දු වෙනවා. තවත් අය, ගම්බද ප්‍රශ්න ගැන කතා කරන්නේ නගරයේ ඉඳලයි. ගැමි දරුවන්ට ඉහළට ඉගෙන ගැනීමට අවස්ථාව කියන්නේ, ඒ අයට ගමෙන් එළියට යන්න පාලමක් තනාදීමයි. අපේ ගමේ තත්වය ගැන බැලූවිටදී එය පැහැදිලිව පේනවා. ගමෙන් ගොඩ නැගුනු උගතුන් බොහෝ දෙනෙක් ඇතත් ඒ අයට අපේ ගමේ ජනතාවගේ හද ගැස්ම කෙරෙහි කළහැකි බලපෑම ඉතාම අල්පයි. මෙසේ වී ඇත්තේ ගම හැරදා පලා යාම නිසයි. ඒ අය ගමේ කටයුතුවලට ඉතිරිවන අයගෙ දැනුම් තේරුම් අඩුයි. මේ තත්වය සම්පූර්ණයෙන්ම අනිත් පැත්තට හරවන්න ඕන. ඒ කියන්නෙ පිටිසර ප්‍රදේශයකින් බිහිවෙන උගතුන්ගෙ බුද්ධිමතුන්ගෙ සේවය තමන් බිහිකළ පරිසරයටත් ලැබෙනවා නම් ඒක ඉතාම වාසනාවක්."

"ඔබේ ගමේ ස්වේච්ඡා සංවිධාන ගැන අදහස් පැහැදිලි කරන්න" මං ඉල්ලීමක් කළා. ගම්බදයයි සඳහන් ස්වේච්ඡා සංවිධාන 30 කට අධික සංඛ්‍යාවක් ඇතත් අපේ ගමේ ඇත්තේ කීපයයි. විශේෂයෙන් මරණාධාර සමිතියකින් සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. සමුපකාර ප්‍රාදේශික කාරක සභාව බලතල නොමැති ආයතනයක්.

ඒ ඇයි? "සමුපකාර සමිති ගම් මට්ටමේ අයගේ පාලනයෙන් බැහැර වෙලා. ඉස්සර සමුපකාර කඩ සමිති ආරම්භ කළේ අපේ ගමේ අයගෙ මෙහෙයවීමෙන් සහ කැපවීමෙන්. නමුත් දැන් ප්‍රතිසංවිධානයෙන් පස්සේ එය පාලනය වන්නේ, විශාල ප්‍රාථමික සමිතියක ශාඛාවක් ලෙස. මෙතැනදී ගම්බද ජනතාව සමුපකාරයෙන් තද බද ලෙස ඈත්වෙලා. අනිත් අතට ග්‍රාමසංවර්ධන සමිතියක් අපේ ගමේ සංවිධානව ඇතත්, එහි කටයුතු සීමා වෙලා තියෙනවා ආර්ථික අමාරුකම් නිසා."

සාකච්ඡාකළේ

**විමර්ශක**

**ලලිත් ජයසූරිය**

"ඔව්, පොදුවේ බලන විටදී රටේ හැම තැනම පැතිරුනු සමිති ඇත්තේ කිහිපයයි. සමහර කාලවලදී හතු පිපෙන්නා වාගේ සමිති ගොඩ නැගෙන්නේ යම්කිසි අමතර පුද්ගලික වාසියක් බලාගත් පුද්ගලයින්ගේ අවශ්‍යතා මතයි. උදහරණයක් වශයෙන් ග්‍රාමෝදය සභා පිහිටුවීම, රජයේ කොන්ත්‍රාත් ස්වේච්ඡා සංවිධානවලට දීමට සූදනම් වීම එවැනි අවස්ථාවලදී මේ බෝඩ් ලෑලි සමිති බිහි වුනා. ඒත් ඒවායේ ජනතා සහභාගිත්වයක් නැහැ. මේ නිසා මෙවැනි සමිතිවල අදහස් අනුව තීරණවලට එළඹෙනොත් කරන්නේ විශාල වරදක්."

"ගම්බදට වැඩි වැඩියේ ආධාර අවශ්‍යයි. නමුත් විශේෂයෙන් සඳහන් කළයුතු කරුණු තියෙනවා. ඉන් එකක්, රජයේ ආධාර යම් සංවිධානයකට දීමේදී ඒවා දුප්පත්ම කොටස්වලට ලැබෙනවාද යන්න ගැන සැලකිලිමත් වියයුතු බවයි.

ගම්බද සංවිධාන කටයුතු ගැන දීර්ඝ කාලයක සිට නිරතව සිටින්නෙකු වන ශ්‍රී ලංකා සමුපකාර ණය දෙන සමිති මහා සංගමයේ ගරු ලේකම් පී. ඒ. කිරිවන්දෙණිය මහතා, "ගම්බද සමිති සමාගම් වර්ග 36 ක් පසුගියද ග්‍රාමෝදය මණ්ඩල පනත යටතේ නම් කර තිබුණා. මේ අතර නිතිපතා රැස් වෙන, නියමිත ව්‍යවස්ථාවක් ඇති රජයේ වාර්ෂික විගනයකට භාජනය වන්නාවූ, සමිති සංඛ්‍යාව අල්පයි. ඒ අතරින් එකක් තමයි සමුපකාර ණය දෙන සමිති. අනික් අතට ගම්බද සැබෑ ආර්ථික ශක්තියක් ඇති සමිති අතර ඉදිරියෙන්ම තිබෙනවා. ඒ නිසා රටේ ආර්ථික සැළසුම් ක්‍රියාත්මක කිරීමට මේවා උපයෝගී කරගත හැක. මවිසින් කරන ලද නොයෙකුත් අත්හද බැලීම්වලින් තේරුම් ගෙන තිබෙනවා ග්‍රාමීය ජනතාව සතු අසීමිත නිර්මාණාත්මක හැකියාවන්. ඒ අනුව අපට විශ්වාසයි සැබෑ ලෙසම ගැමියන් අතරට සංවර්ධන සැලසුම් ගෙන යන්න

නම්, සංවර්ධනයට ඔවුන් සහභාගි කරවා ගන්න නම්,ගම්බද ස්වේච්ඡා සංවිධාන සාධක කරගත යුතුයි.''

මහවැලි ව්‍යාපාරයේ ගොවියෙකු වන අනුරාධපුරයේ නොච්චියාගම පුංචි බණ්ඩා රත්නායක මහතා, දැන් ජීවත් වන්නේ අමුතු සමාජ රටාවක් ඇති, නවතම පරිසරයකයි. ප්‍රධාන වශයෙන් කෘෂිකර්මයෙන් යැපෙන, සමාන ඉඩම් අයිතියක් ඇති මේ''මහවැලි සමාජයේ'' ජීවන ක්‍රමය තුළ ඔවුන්ට ඇති වන්නේ නව රටාවක ප්‍රශ්න සමුදයක්. ඒවාට පැරණි ග්‍රාම සංවර්ධන හෝ වෙනත් ආකාරවල ස්වේච්ඡා සංවිධාන වලින් පුලුල් ලෙස විසඳුම් දීම නොහැකි බවත් මේ නිසා, අද ''ප්‍රජා සංවර්ධන සමිති'' නම් අලුත්ම මාදිලියේ සමිති වර්ගයක් හඳුන්වා දී ඇති බවත් ඔහු පැවසුවා.

''මේ සමිති කෙලින්ම මහවැලි අධිකාරියේ නිලධාරීන් සමග සම්බන්ධවයි ගොඩනැගී ඇත්තේ. ඒ ඒ අවස්ථාවල පැන නගින ගැටළු විසඳ ගැනීමට හැකිවන පරිදි අදාළ නිලධාරීන් ගම්වලම, ඒකකවලම පදිංචිව සිටීම ලොකු පිළිසරණක්. අනිත් අතට අප කාටත් ඇත්තේ සමාන ආකාරයේ ප්‍රශ්න. විශේෂයෙන්ම ගොවි කටයුතු සම්බන්ධ වූ ප්‍රශ්නයි. ඒවා විසඳුන හොත් අපේ ජීවිතයේ ජයග්‍රහණය අත ළඟයි. මේ නිසා ඒ ප්‍රශ්න විසඳීමට හැකියාව ඇති එකම ආයතනයවූ මහවැලි අධිකාරිය කෙරෙහි අපි බලාපොරොත්තු තබනවා. විශේෂයෙන්ම අපි සමිතිවල නිලධාරීන් තෝරා ගත ඇත්තේ අප සමිතිවල සාමාජිකයින්ගේ ඡන්දයෙනුයි.....